# 11 දේව රාජ්‍යය



11.1 රූපය - "දයා ප්‍රේමය ඇති තැන
දෙවියෝ වැඩ වසනු ඇත"

රාජ්‍යයක් යනු යම් දේශ සීමාවක් තුළ යම් ප්‍රතිපත්තියක් හෝ ව්‍යවස්ථා මාලාවක් තුළ පාලකයන් හා පාලිතයින් අතර සම්මුතියෙන් සිදු වන පාලනයකි. දේව රාජ්‍යය මෙවැනි ලෞකික රාජ්‍යයක් නොවේ. දේව රාජ්‍යයට දේශ සීමා නැත. එසේ නම් දෙවියන් වහන්සේගේ රාජ්‍යය; ඉහළ අහසෙහි ද?
පහළ පොළොවෙහි ද?
ඔබ තුළ ද?
මා තුළ ද?
නැත්නම් තව ම පැමිණ නැත් ද?

**දේව රාජ්‍යය යනු**

දේව රාජ්‍යය නම් දේව කැමැත්තට හා දේව පාලනයට නතුවීම ය.

ජේසුස් වහන්සේගේ වචන සහ ක්‍රියාවන්ගේ හරය වූයේ දේව රාජ්‍යයේ උදව ය. දේව රාජ්‍යයේ උදව අත්දැකිය හැක්කේ ජීවිත පරිණාමයත් වෙනසත් තුළිනි (මාක් 1:15).

ස්වර්ගයේ ජීවත් වීම යනු "ක්‍රිස්තුන් වහන්සේ සමග විසීම යි" තෝරාගනු ලැබුවෝ "ක්‍රිස්තුන් වහන්සේ තුළ" ජීවත් වෙති. එහෙත් ඔවුහු ඔවුන්ගේ සැබෑ අනන්‍යතාව ද ඔවුන්ගේ නාමය ද එලෙස ම රැක ගනිති. ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමාට අනුව ජීවත් වීම යනු ක්‍රිස්තුන් වහන්සේ සමග විසීම ය. ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටින්නේ කොතැන ද එහි ජීවනය ද දේව රාජ්‍යය ද ඇත.
(කතෝලික සභා ධර්මෝපදේශය 1025)

**ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වටිනාකම් උපමා මගින් ඉගැන්වූ සේක.**

උදහරණ :-

- ⋆ වපුරන්නා පිළිබඳ උපමාව (මතෙව් 13:1-23)
- ⋆ කිරිඳි පිළිබඳ උපමාව (මතෙව් 13:24-30)
- ⋆ අබ ඇටය සහ මුහුන් පිළිබඳ උපමා (මතෙව් 13:31-43)
- ⋆ නිධානය, මුතු ඇටය සහ දැල පිළිබඳ උපමා (මතෙව් 13:44-53)

**වපුරන්නා පිළිබඳ උපමාව**



11.2 රූපය - වපුරන්නාගේ උපමාව

| බීජ වැටුණ බිම | බීජවලට සිදු වූ දේ | උපමාවේ විවරණය |
|---|---|---|
| මග දිගේ වැටුණු බීජ | කුරුල්ලෝ ඒවා අහුලා කෑහ. | සිතේ වැපුරූ දේ නපුරා අවුත් පැහැර ගනියි. |
| පස් නැති ගල් බිමේ වැටුණු බීජ | වහා පැළවූ නමුත් හිරු නැගුණු විට මුල් නැති බැවින් වියළී ගියේ ය. | පණිවිඩය ඇසූ කෙනෙහි ම එය සතුටින් පිළිගත්තත් සිතෙහි තැන්පත් වී නැති බැවින්, මද කලක් පැවත පණිවිඩය නිසා හිංසාවක් හෝ පීඩාවක් පැමිණි වහා ම කෙනෙක් පැකිළී වැටෙති. |
| කටු අතර වැටුණු බීජ | කටු ගස් වැවී ඒවා යට කර දැමී ය. | පණිවිඩය අසා මේ ජීවිතයේ කරදරවලින් ද වස්තු මායාවෙන් ද පණිවිඩය යටපත් වීම නිසා කෙනෙක් ඵල නොදරති. |
| සරු බිමෙහි වැටුණු බීජ | එකකින් සිය ගුණයක් ද එකකින් හැට ගුණයක් ද එකකින් තිස් ගුණයක් ද ඵල දැරී ය. | පණිවුඩය අසා එය වටහා ගෙන සිය ගුණයක් ද හැට ගුණයක් ද තිස් ගුණයක් ද බැගින් කෙනෙක් ඵල දරති. |

**ජේසුස් වහන්සේ දේශනා මගින් දේව රාජ්‍යය පිළිබඳ ව ජනතාවට පහදා දුන් සේක.**

දෙවියන් වහන්සේගේ රාජ්‍යය කවර කලෙක පහළ වන්නේ දැ”යි පරිසිවරුන් ඇසූ බැවින්, උන්වහන්සේ ඔවුනට උත්තර දෙමින්, "දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඇසට පෙනෙන අයුරින් නොපැමිණෙයි. මෙන්න මෙතැන ය. අන්න අතන යැයි කිසිවෙකුට කිව නොහැකි ය, මන්ද, දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ අතරෙහි ය”යි වදාළ සේක.

(ලූක් 17:20-25)

එම නිසා උන්වහන්සේගේ රාජ්‍යය සොයමින් හතිලමින් දුවන්නට අවශ්‍ය නැත. උන්වහන්සේගේ රාජ්‍යය අප තුළ ය; අප අතර ය. අප ජීවත් වන සැම තැන ම දේව රාජ්‍යය උදා කර ගැනීමට අපි සැම ආශා කරමු. ඒ ආශාව මුදුන්පත් කර ගැනීමට නම් අපි සැම ජේසුස් වහන්සේ දේශනා කළ කන්ද උඩ දේශනාව නිතර කියවා එම ඉගැන්වීම්වලට අනුව දිවි ගෙවිය යුතු වෙමු.

## කන්ද උඩ දේශනාව මගින් උගන්වන දේව රාජ්‍යයේ වටිනාකම්



මතෙව් 5, 6 සහ 7 පරිච්ඡේදවල කන්ද උඩ දේශනාව අන්තර්ගත වේ. එහි සඳහන් ඉගැන්වීම් අතරින් කිහිපයක් පහත දැක්වේ:

- ⋆ භාග්‍ය අට (මතෙව් 5:1-12)
- ⋆ පොළොවේ ලුණු සහ ලෝකයේ ආලෝකය (මතෙව් 5:13-16)
- ⋆ පළිගැනීම පිළිබඳ ඉගැන්වීම් (මතෙව් 5:38-42)
- ⋆ සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම (මතෙව් 5:43-48)
- ⋆ දන් දීම පිළිබඳ ඉගැන්වීම් (මතෙව් 6:1-4)
- ⋆ උපවාසය පිළිබඳ ඉගැන්වීම (මතෙව් 6:16-18)
- ⋆ සග සම්පත් (මතෙව් 6:19-21)
- ⋆ කරදර වීම (මතෙව් 6:25-34)
- ⋆ රන් අණ (මතෙව් 7:12)
- ⋆ පටු දොරටුව (මතෙව් 7:13-14)
- ⋆ කීම සහ කිරීම (මතෙව් 7:21-23)
- ⋆ අත්තිවාරම් දෙක (මතෙව් 7:24-29)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**භාග්‍ය 8 තුළින් දේව රාජ්‍යයේ වටිනාකම්**

1. "බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය; ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය."
2. "ශෝක වන්නෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු සැනසීම ලබන්නෝ ය."
3. "නිහතමානි ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු දේශය උරුම කර ගන්නෝ ය."
4. "යුක්තියට සා පිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු තෘප්තිමත් වන්නෝ ය."
5. "දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු දයාව ලබන්නෝ ය."
6. "නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු දෙවියන් වහන්සේ දකින්නෝ ය."
7. "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය යි කියනු ලබන්නෝ ය."
8. "යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ ය; ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය."

ජේසුස් වහන්සේ භාග්‍යය අට තුළින් දේව රාජ්‍යයේ වටිනාකම් ගෙන හැර දක්වයි. අප තුළ හා අප අතර දේව රාජ්‍යය ගොඩනැංවීමට දුන් භාග්‍ය අට ප්‍රයෝජනයට ගෙන සාමයේ ප්‍රීතියේ හා ප්‍රේමයේ ලොවක් ගොඩනගමු.

## ශ්‍රී ලංකාවේ සාරධර්ම තුළින් දේව රාජ්‍යයේ වටිනාකම්

දේව රාජ්‍යයේ වටිනාකම් වැඩි දියුණු කිරීමට ජේසුස් වහන්සේ අපට ආරාධනා කරන සේක. එවැනි සාරධර්ම කිහිපයක් මෙසේ ය. ඒ සඳහා ශ්‍රී ලංකාවේ පවතින සාරධර්ම මහෝපකාරි වේ.

- දෑත් එක්කර "ජේසු පිහිටයි!" කීම
- නිවසින් බැහැර ව යාමට පෙර සහ සැම වැදගත් කාර්යයකට ම පෙර කුරුසියේ ලකුණ ඇඳීම හෝ යාච්ඤාවක් කීම
- දෙමව්පියන්ට හා ගුරුවරුන්ට වැඳීම
- අන් අයගේ පෞද්ගලික කථාවලට සවන් නොදීම
- වැඩිහිටියෙක් පැමිණෙන විට අසුනින් නැගිටීම
- වැඩිහිටියන්ට ඉහළින් වාඩි නොවීම
- අත් වැරැද්දක් වූ විට සමාව ඉල්ලීම

මේවාට අමතර ව තවත් බොහෝ සාරධර්ම ඇත. ඒවා ආරක්ෂා කරමින් ඒවා ජීවත් කරවීමට ක්‍රියා කිරීම තුළින් ද අප සිදු කරනුයේ දේව රාජ්‍යය වෙත ජනතාව යොමු කිරීම ය. දේව රාජ්‍යය උරුම කර ගැනීමට දෙවියන් වහන්සේ අප සියලු දෙනා කැඳවන බව වටහා ගෙන අපට හැකි උපරිමයෙන් ඒ සඳහා කැපවිය යුතු ව ඇත.

**ක්‍රියාකාරකම**

1. පහත වගුව සම්පූර්ණ කරන්න.

| උපමාව | උපමාව ලුහුඩින් | ලැබෙන පණිවිඩය |
|---|---|---|
| i. කිරිදි පිළිබඳ උපමාව | | |
| ii. අබ ඇටය පිළිබඳ උපමාව | | |
| iii. මුහුන් පිළිබඳ උපමාව | | |
| iv. නිධානය පිළිබඳ උපමාව | | |
| v. මුතු ඇටය පිළිබඳ උපමාව | | |
| vi. දැල පිළිබඳ උපමාව | | |

2. කන්ද උඩ දේශනාව අනුසාරයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ඉගැන්වීම | ඔබට ලැබෙන පණිවිඩය |
|---|---|
| 1. පළිගැනීම පිළිබඳ ඉගැන්වීම | ........................................................ |
| 2. දන් දීම පිළිබඳ ඉගැන්වීම | ........................................................ |
| 3. උපවාස පිළිබඳ ඉගැන්වීම | ........................................................ |



**ජීවිතයට බිඳක්**

- ★ *භාග්‍ය අට අනුසාර කරමු.*
- ★ *කිතුනු සාරධර්ම අනුව ජීවත් වීමට වෙර දරමු.*